# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/67 – 2019 ජුනි 08 වැනි සෙනසුරාදා – 2019.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ සුළු කොට්ඨාසයේ, වේවැල්තලාව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එන්යූ/ඒඑම්බී/2014/113 හා 2017.06.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වේවැල්තලාව – ප්‍රමාණය: හෙක්. 3.8750**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වේවැල්තලාව.

ගයන්ත කරුණාතිලක,<br>ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2013/FR/85.<br>2019 අප්‍රේල් මස 11 වැනි දින,<br>ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල.

07 - 691

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ, මතුගොඩේ (අ.ග.පි. 169) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/කේටීපී/2017/34 හා 2017.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'බී' – දෙනියාය වත්ත හැන්ඩ්පර්ඩ් කොටස, (ක්ෂේත්‍ර අංක 8) – ප්‍රමාණය: හෙක්. 1.5524**

උතුරට: සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන හැන්ඩ්පර්ඩ් හංසවිලා ගම්මානය; නැගෙනහිරට: සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන හැන්ඩ්පර්ඩ් හංසවිලා ගම්මානය, මාර්ගය (මා.සං.අ.) සහ සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය; දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය; බටහිරට: සී/ස තලවකැලේ වතු සමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය සහ කැබලි අක්ෂර ඒ.

ගයන්ත කරුණාතිලක,<br>ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2014/VE/308.<br>2019 මැයි මස 07 වැනි දින,<br>ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල.

07 - 692


1A – G 30266 – 31 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*